සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2023

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2023

## I පත්‍රය

පැය එකයි.

විභාග අංකය : ......................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත රූපය නිරීක්ෂණය කරන්න. ඒ පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) ළමයි හයදෙනෙක් ද සත්තු කිහිපදෙනෙක් ද සිටිති.

(2) අශ්වයා ළඟම සිටින ළමයා හිස්වැස්මක් පැළඳ සිටියි.

(3) ළමයි සියලුදෙනා කණ්ඩායම් ක්‍රීඩාවක නිරතව සිටිති.

**2.** පහත රූපයෙහි A සහ B ලෙස සටහන් කර ඇති හිස්තැන් සඳහා පිළිවෙළින් ගැළපෙන රූප කොටස් දෙක මොනවා ද?





(1) 

(2) 

(3) 

**3.** පහත ඇති A, B, C, D, E යන රූපවලින් සමාන රූප දෙක මොනවා ද?




(1) A සහ B (2) A සහ D (3) C සහ E

**4.** පහත ඇති කවියෙහි හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.


රන්වන් අත්තටු දිළිසෙනවා
............... එහෙ මෙහෙ පාවෙනවා
මල්වල වහලා ............... බොනවා
............... යැයි පවසනවා


(1) අහසේ දිය මී මැස්සකු

(2) සුළඟේ රොන් සරුංගලේ

(3) සුළඟේ පැණි සමනළයකු

**5.** පහත සටහනෙහි හිස් කොටුවට ගැළපෙන රූපය කුමක් ද?



(1)  (2)  (3) 

**6.** රුවන්ගේ මවගේ සහෝදරයාගේ දියණිය රුවිනි නම්, රුවන් යනු රුවිනිගේ,

(1) පියාගේ සහෝදරියකගේ පුතා වේ.

(2) පියාගේ සහෝදරයකුගේ පුතා වේ.

(3) මවගේ සහෝදරයකුගේ පුතා වේ.

**7.** භාජනයක රතු බෝල 10 ක් ද කහ බෝල 8 ක් ද සුදු බෝල 6 ක් ද ඇත. වරකට රතු බෝල 2 ක් කහ බෝල 1 ක් සහ සුදු බෝල 1 ක් බැගින් ඉවතට ගනු ලැබේ. එසේ බෝල ඉවතට ගත හැකි වාර ගණන අවසන් වූ විට, භාජනයේ ඉතිරි වන මුළු බෝල සංඛ්‍යාව කීය ද?

(1) 2 (2) 4 (3) 6

**8.** එකිනෙකට සෑම අතින් ම සමාන පරිගණක 6 ක් පාසල් දෙකක් අතර බෙදාදීමට අවශ්‍ය වේ. එක් එක් පාසලට ලැබිය හැකි පරිගණක ගණන විවිධ විය හැකි ය. එක් එක් පාසලට එක් පරිගණකයක්වත් ලැබෙන පරිදි එම පරිගණක හයම බෙදා දිය හැකි වෙනස් ආකාර කීයක් තිබේ ද?

(1) 5 (2) 6 (3) 7

**9.** අමර ඉපදුනේ එක්තරා වර්ෂයක ජනවාරි මාසයේ අවසාන ඉරිදා ය. සාමා ඉපදුනේ එම වර්ෂයේම පෙබරවාරි මාසයේ මුල්ම ඉරිදා ය. මෙම දින දෙකෙහි එකතුව 38 කි. අමරගේ උපන්දිනය ජනවාරි මාසයේ,

(1) 29 දින වේ. (2) 30 දින වේ. (3) 31 දින වේ.


**10.** නිමාලි නිමල්ට වඩා අවුරුදු දෙකහමාරක් බාල ය. නිමල් ඉපදුනේ 2005 වර්ෂයේදී ය. නිමාලි ඉපදුනේ,

(1) නිසැකවම 2007 වර්ෂයේදී විය යුතු ය.

(2) නිසැකවම 2008 වර්ෂයේදී විය යුතු ය.

(3) 2007 හෝ 2008 යන වර්ෂ දෙකින් එකක ය.

**11.** රූපයේ දැක්වෙන කොටුදැලෙහි හිස්කොටු හතර 3, 4, 5, 6 යන ඉලක්කම් හතරෙන් පිරවිය යුත්තේ පොදු මායිම් රේඛාවලින් වෙන්වන සෑම කොටු දෙකකම ඇති ඉලක්කම් දෙකෙහි වෙනස 1 **නොවන** පරිදි ය. එසේ කොටුදැල පිරවිය හැකි ආකාර කීයක් තිබේ ද?




(1) 1 (2) 2 (3) 3

**12.** "කමල්ගේ එකම සහෝදරයා විමල් ය. අමාලි යනු කමල්ගේ සහෝදරියකි. අමාලිගේ එකම සහෝදරිය හිමාලි ය." ඒ අනුව හිමාලිට සිටින සහෝදරයින් ගණනත් සහෝදරියන් ගණනත් පිළිවෙළින්,

(1) 2 සහ 2 වේ. (2) 1 සහ 2 වේ. (3) 2 සහ 1 වේ.


**13.** සමතලා බිමක ඇඳ ඇති සමචතුරස්‍රයක ශීර්ෂවල A, B, C, D හතරදෙනා සිටගෙන සිටින්නේ A ට උතුරින් B ද, B ට බටහිරින් C ද, C ට දකුණින් D ද වන පරිදි ය. A සිටින්නේ පිළිවෙළින් C ටත් D ටත් කවර දිශාවලින් ද?

(1) ගිනිකොන, නැගෙනහිර (2) ගිනිකොන, බටහිර (3) වයඹ, නැගෙනහිර

**14.** 


වීමට,


? ඇති තැනට සුදුසු රූපය කුමක් ද?



(1) (2) (3)


**15.** පහත සඳහන් රූප රටාවේ ? ඇති තැනට ආ යුතු රූපය කුමක් ද?






(1) (2) (3)


**16.** පහත සඳහන් රූප රටාවේ ? ඇති තැනට ආ යුතු රූපය කුමක් ද?





(1) (2) (3)

**17.**




රූපයේ දැක්වෙන වළල්ලේ සුදු බෝල 3 ක් සහ කළු බෝල 3 ක් තබා ඇත. ↓ ඇති බෝලයෙන් 'එක' ලෙස පටන්ගෙන දක්ෂිණාවර්තව එක දෙක තුන වශයෙන් ගණන් කර 'තුන' ලෙස කියවෙන බෝලය ඉවත් කෙරේ. ඊළඟ බෝලයෙන් පටන්ගෙන එක දෙක තුන වශයෙන් ගණන් කර 'තුන' ලෙස කියවෙන බෝලය ද ඉවත් කෙරේ. මේ ආකාරයට බෝල දෙකක් පමණක් ඉතුරුවන තෙක් මෙම ක්‍රියාවලිය කරගෙන යනු ලැබේ. එවිට ඉතුරු වන්නේ,

(1) කළු බෝල 2 කි.
(2) සුදු බෝල 2 කි.
(3) සුදු බෝලයක් සහ කළු බෝලයකි.

**18.** A, B, C, D නමැති සිවුදෙනෙක් රූපයේ පෙනෙන පරිදි පේළියක සිටගෙන සිටින්නේ,

A ගේ වම් අතින් B ගේ දකුණු අත ද
B ගේ වම් අතින් C ගේ වම් අත ද
C ගේ දකුණු අතින් D ගේ දකුණු අත ද




අල්ලාගෙන ය. එකම දිශාවකට මුහුණලා සිටින තිදෙනා කවුරුන් ද?

(1) A, B, C (2) A, B, D (3) A, C, D

**19.** හොඳින් හිරු පායා ඇති උදෑසනක ශිෂ්‍යයෙක් සමතලා බිමක ඇඳ ඇති වෘත්තාකාර ධාවන පථයක සම්පූර්ණ වට දෙකක් ඇවිදියි. එම ගමනේදී ශිෂ්‍යයාගේ සෙවනැල්ල ඔහුගේ වම් අත පැත්තේ සිට දකුණු අත පැත්තට කී වරක් මාරුවෙයි ද?

(1) 2 (2) 3 (3) 4

Past Papers Wiki



**20.** පහත දී ඇති තොරතුරු සලකන්න.

- සුදු පාට බල්බය දැල්වේ නම් කහ පාට බල්බය ද දැල්වේ.
- රතු පාට බල්බය දැල්වේ නම් සුදු පාට බල්බය නොදැල්වේ.
- රතු පාට බල්බය නොදැල්වේ නම් නිල් පාට බල්බය දැල්වේ.

ඒ අනුව එකවර දැල්විය හැකි බල්බ තුන වන්නේ,

(1) සුදු, කහ සහ රතු ය. (2) සුදු, කහ සහ නිල් ය. (3) සුදු, රතු සහ නිල් ය.

**21.** පහත රූපයෙන් දක්වා ඇති මාලය එක් තැනකින් ගලවා දිගට සිටින සේ මේසයක් මත තබන ලදී. එය නිවැරදිව පෙන්වන ආකාරය කුමක් ද?




(1) 

(2) 

(3) 

**22.** පහත මෝටර් රථයේ රෝදයක වට ප්‍රමාණය මීටර 2 කි. මෝටර් රථය දැනට ඇති ස්ථානයේ සිට මීටර 10 ක් ඉදිරියට ගමන් කර ඉන්පසුව මීටර 2 ක් පසුපසට ගොස් නතර කරන ලදී. මෙම ගමන් කිරීමේදී මෝටර් රථයේ පසුපස රෝදයේ ↑ යොමු කර ඇති ස්ථානය පොළවට ස්පර්ශ වන වාර ගණන කීය ද?




(1) 6


(2) 7

(3) 8

**23.** පහත දැක්වෙන්නේ කාඩ්බෝඩ්වලින් සකස් කළ, සිදුරු දෙකක් බැගින් ඇති හැඩතල හතරක් සහ ඒවා රැඳවීම සඳහා සකස් කළ කූරු සහිත ආධාරකයකි.




එම හැඩතල A සිට D තෙක් අනුපිළිවෙළින් එක මත එක සිටින සේ ආධාරකයෙහි රඳවන ලදී. ඒ දෙස ඉහළින් බැලූ විට පෙනෙන ආකාරය කුමක් ද?


(1)


(2)


(3)


**24.** වෘත්තාකාර ධාවන පථයක ඇතුළත සීමාවේ දිග මීටර 200 කි. මීටර 10 න් 10 ට සලකුණු කිරීම සඳහා මුලින්ම කහ පාට කොඩියක් ද, දෙවනුව දම් පාට කොඩියක් ද, තුන්වෙනුව සුදු පාට කොඩියක් ද ආදී වශයෙන් වන පරිදි මෙම පාට තුනෙන් කොඩි සිටුවන ලදී. මේ පිළිවෙළට සලකුණු කිරීම අවසන් වූ විට සමාන කොඩි ගණනක් ඇත්තේ කවර ඒවා ද?

(1) කහ පාට සහ දම් පාට (2) දම් පාට සහ සුදු පාට (3) සුදු පාට සහ කහ පාට

**25.** දරුවන් සිවුදෙනකු සිටින එක්තරා පවුලක වැඩිමහල් ම දරුවා පිරිමි ය. ඔහුට මල්ලිලා දෙදෙනෙක් ද නංගී කෙනෙක් ද සිටිති. මෙම පවුලේ බාල ම දරුවාට අයියලා දෙදෙනෙක් ද අක්කා කෙනෙක් ද සිටිති. වැඩිමහල් ම දරුවා සහ බාල ම දරුවා හැර අනෙක් දරුවන් දෙදෙනා පිළිබඳව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) දෙදෙනා ම පිරිමි වේ. (2) දෙදෙනා ම ගැහැනු වේ. (3) එක් අයෙක් පමණක් පිරිමි වේ.

**26.** පහත සඳහන් A, B, C රූප බලන්න. වර්ගඵලය අනුව ඒවායින් දෙකක් සමාන ය. එකක් අසමාන ය. **අසමාන** රූපය කුමක් ද?




(1) A (2) B (3) C

**27.** ඔරලෝසුවක වේලාව 1.00, 2.00, 3.00, … ආදී වශයෙන් වන විට පිළිවෙළින් එක්වරක්, දෙවරක්, තුන්වරක්, … ආදී වශයෙන් නාද වෙයි. ඒ අතරතුර 30 වන මිනිත්තුවේදී එක්වරක් බැගින් ද නාද වෙයි. සෙනසුරාදා පෙරවරුවේ රවිඳු පාඩම් කරමින් සිටි කාලය තුළ ඔරලෝසුව 24 වරක් නාදවනු ඔහුට ඇසුණි. ඔහු පාඩම් කිරීම අවසන් කළේ පෙ.ව. 11.45 ට නම් පාඩම් කිරීම ආරම්භ කළේ කීයට විය හැකි ද?

(1) පෙ.ව. 9.15 (2) පෙ.ව. 9.45 (3) පෙ.ව. 10.15


**28.** පහත සඳහන් සිදුවීම් සලකන්න.

a - ඊයේ මා නින්දට යන විට මධ්‍යම රාත්‍රිය පසු වී තිබුණි.
b - විවේක කාලයෙන් පසු ගණිත පරීක්ෂණයකුත් තිබුණි.
c - මගේ ක්‍රීඩා ඇඳුම ගෙනැවිත් නැති බව පෙනුණේ ඒ අවස්ථාවේදී ය.
d - ප්‍රමාද වී අවදි වූ මා පාසලට ගියේ කලබලයෙනි.
e - පාසල අවසන් වූ විට මගේ යහළුවා සමග ක්‍රීඩා පුහුණුවට ගියෙමි.

එම සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

(1) a, d, b, e, c (2) a, d, c, b, e (3) d, b, a, c, e

**29.** පහත දී ඇති රූප රාමුවලින් සිද්ධියක අවස්ථා හතරක් දැක්වේ.



A B C D

එම අවස්ථාවල අර්ථවත් අනුපිළිවෙළ කුමක් ද?

(1) B D A C (2) B D C A (3) C A D B

**30.** පතුල සමචතුරස්‍රාකාර පෙට්ටියක ඇතුළත අයින දිගේ කිරිපිටි ටින් 16 ක් පියන උඩු අතට සිටින සේ එකිනෙකට යාව අසුරා ඇත. එම පෙට්ටියේ මැද කොටසේ උපරිම වශයෙන් තවත් එවැනි ම කිරිපිටි ටින් කීයක් එම ආකාරයට ම ඇසිරිය හැකි ද?

(1) 8 (2) 9 (3) 12

**31.** පෙ.ව. 9.30 වන විට කාර්යාලයක් තුළ බාහිර පුද්ගලයෝ පස්දෙනෙක් සිටියහ. එතැන් සිට සෑම මිනිත්තුවකට වරක් දෙදෙනෙක් බැගින් කාර්යාලය තුළට පැමිණෙති. සෑම මිනිත්තු පහකටම වරක් පස්දෙනෙක් පිටවෙති. පෙ.ව. 9.42 අවසානයේදී කාර්යාලය තුළ සිටින බාහිර පුද්ගලයින් ගණන කීය ද?

(1) 14 (2) 17 (3) 19

**32.** විදුලි ආලෝක සංඥා ඇති පදික මාරුවක රතු පාට සහ කොළ පාට මාරුවෙන් මාරුවට දැල්වේ. තත්පර 90 ක කාලයක් රතු පාට දැල්වෙන අතර, කොළ පාට දැල්වෙන්නේ තත්පර 15 කි. මුලින් ම රතු පාට දැල්වුණි නම්, එතැන් සිට මිනිත්තු 5 ක කාලයක් තුළ කොළ පාට දැල් වී තිබූ මුළු කාලය තත්පර කීය ද?

(1) 30 (2) 45 (3) 60

**33.** පහත ඡේදය කියවන්න.

"සිංහරාජ වනාන්තරය ශ්‍රී ලංකාවේ නිරිත දිග පහතරට තෙත් කලාපයේ සබරගමුව හා දකුණු පළාත් සීමා තුළ පිහිටා ඇත. එහි විශාලත්වය වර්ග කිලෝමීටර 88.64 ක් පමණ වන බව ගණන් බලා ඇත. එය දුර්ලභ ගස්වැල් රාශියකටත් වන සතුන් ගණනාවකටත් නිජබිම වී ඇත. යුනෙස්කෝ ආයතනය විසින් මෙය ලෝක උරුමයක් වශයෙන් නම් කර ඇත."

මෙම ඡේදයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) යුනෙස්කෝ ආයතනය විසින් සිංහරාජ වනාන්තරයේ විශාලත්වය වර්ග කිලෝමීටර 88.64 ක් බව ප්‍රකාශ කර ඇත.

(2) මෙහි වාසය කළ සිංහරාජයකු නිසා සිංහරාජ වනාන්තරයට එම නම ලැබුණු බව විශ්වාස කෙරේ.

(3) සිංහරාජ වනාන්තරයේ කොටසක් සබරගමුව පළාතටත් කොටසක් දකුණු පළාතටත් අයත් වේ.

**34.** "බල්ලා මාංශ භක්ෂකයෙකි. නිමල්ගේ සුරතලා ද මාංශ භක්ෂකයෙකි." ඒ අනුව නිමල්ගේ සුරතලා පිළිබඳව එළඹිය හැකි හොඳම නිගමනය කුමක් ද?


(1) නිසැකවම බල්ලෙක් වේ.

(2) බල්ලකු වීමට හෝ නොවීමට හෝ පුළුවන.


(3) බල්ලෙක් නොවේ, එහෙත් මාංශ භක්ෂකයෙක් වේ.

**35.**


A




B




C




සමචතුරස්‍ර හැඩැති කඩදාසියක් කඩඉරි දිගේ නවන ලද ආකාරය A, B සහ C රූපවල දැක්වේ. C රූපයේ දැක්වෙන පරිදි ස්ථාන තුනකින් කුඩා කොටස් කපා ඉවත් කර කඩදාසිය සම්පූර්ණයෙන් දිග හැරිය විට ලැබෙන්නේ කුමක් ද?



(1)



(2)



(3)

**36.** සචිනිගේ ගවුමෙහි පාට නිවැරදි ව තීරණය කිරීමට අවශ්‍යවන ප්‍රකාශ දෙක මොනවා ද?

A - කමනිගේ ගවුම රතු පාට ය.

B - රුවනිගේ ගවුම සචිනිගේ ගවුමට වඩා ළා පාට ය.

C - රුවනිගේ ගවුම කමනිගේ ගවුමට වඩා ළා පාට ය.


D - කමනිගේ ගවුමේ පාට සචිනිගේ ගවුමේ පාටට සමාන ය.

(1) A සහ D (2) B සහ C (3) B සහ D

[අටවැනි පිටුව බලන්න.

**37.** පහත කොටු දැල සහ එහි ගමන් කිරීම සඳහා දී ඇති සලකුණු බලන්න.

<u>කොටු දැල</u>




<u>සලකුණු</u>

↑ දිශාවට හැරෙන්න.

→ කොටුවක පැත්තක දුර ඉදිරියට යන්න.

වමට හැරී කොටුවක පැත්තක දුර ඉදිරියට යන්න.

දකුණට හැරී කොටුවක පැත්තක දුර ඉදිරියට යන්න.


■ නවතින්න.

ඉහත ඇති සලකුණුවලට අනුව A ස්ථානයෙන් අරඹා

↑ → → ↱ → ↴ → → ↴ → ■ මගින් දැක්වෙන පරිදි ගමන් කරන අයකු ගමන අවසන් කරන ස්ථානය කුමක් ද?


(1) B (2) C (3) D


**38.** හිස්තැනට ආ යුතු රූපය කුමක් ද?



(1) (2) (3)

**39.** පහත රූපයේ දැක්වෙන්නේ කුඩා ඝනක එකතු කර සකස් කළ හැකි විශාල ඝනකයක එක් කොටසකි. එය සම්පූර්ණ කිරීම සඳහා A, B, C හා D යනුවෙන් දී ඇති කොටස්වලින් දෙකක් අවශ්‍ය ය. ඒවා මොනවා ද?






(1) A හා B (2) A හා C (3) B හා D

**40.** A, B, C ලෙස නම් කරන ලද ඔරලෝසු තුනක, එකම දිනක අවස්ථා දෙකකදී දැක්වුණු වේලාව වගුවෙහි දී ඇත.

| ඔරලෝසුව | A | B | C |
|---|---|---|---|
| පළමුවන අවස්ථාවේ දැක්වුණු වේලාව | පෙ.ව. 6.00 | පෙ.ව. 6.05 | පෙ.ව. 6.10 |
| දෙවන අවස්ථාවේ දැක්වුණු වේලාව | පෙ.ව. 9.00 | පෙ.ව. 9.05 | පෙ.ව. 9.15 |

මේ අනුව වඩාත් නිවැරදි නිගමනය කුමක් ද?

(1) එක් ඔරලෝසුවක් පමණක් නිවැරදි වේලාව දක්වයි.

(2) එක් ඔරලෝසුවක පමණක් ක්‍රියාකාරිත්වය දෝෂ සහිත වේ.

(3) අඩු තරමින් ඔරලෝසු දෙකක්වත් වැරදි වේලාව දක්වයි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2023**

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2023

## II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය** :..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත දැක්වෙන කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන එට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවැනි පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවැනි පරීක්ෂක** පළමුවැනි පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

සඳුදා පැවති පාසලේ උදෑසන රැස්වීමේ, සිසු දක්ෂතා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇරඹුණි. පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යාවක වූ නිමාලි පළමුවෙන් ම ඉදිරිපත් වූ අතර ඇය 'දින චර්යාව' මාතෘකාව කර ගනිමින් තම අදහස් ඉදිරිපත් කළා ය. කාලසටහනකට අනුව වැඩ කිරීමේ වැදගත්කම පන්තිභාර ගුරුතුමිය කියා දුන් බවත් තමා ද කාලසටහනකට අනුව වැඩ කරන බවත් නිමාලි පැවසුවා ය. ඒ අනුව තමා උදෑසන ම අවදි වී නිවසේ වැඩකටයුතුවලට උදවු වීම හා සවස් කාලයේ දී ගෙවත්තේ වැඩවලට උදවු වීම අමතක නොකර සිදුකරන බව ද පැවසී ය. කතාව නිම කරමින් ඇය තම ගෙවත්ත නැරඹීමට එන ලෙස ද ආරාධනා කළා ය. පන්තිභාර ගුරුතුමිය නිමාලිගේ කතාව අගය කරමින් කියා සිටියේ නිමාලි දිනපතා පාසලට පැමිණෙන සහ පාසලේ කටයුතු අතපසු නොකරන ශිෂ්‍යාවක බවයි.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

(i) පාසලේ උදෑසන රැස්වීම පැවති දවස කුමක් ද?

..............................................................................................................

(ii) නිමාලි ඇගේ කතාව සඳහා මාතෘකාව කර ගත්තේ කුමක් ද?

..............................................................................................................

(iii) නිමාලිගේ කතාවේ ඇතුළත් ඇය විසින් දිනපතා සවස් කාලයේ කරන කාර්යය කුමක් ද?

..............................................................................................................

(iv) කතාව අවසානයේ දී නිමාලි විසින් කරන ලද ඉල්ලීම කුමක් ද?

..............................................................................................................

(v) නිමාලි ඉදිරිපත් කළ මාතෘකාවට උදවු වූයේ ගුරුතුමිය කියා දුන් කුමන කරුණක් ද?

..............................................................................................................

(vi) පන්තිභාර ගුරුතුමිය නිමාලිගේ කතාව අගය කරමින් පැවසුවේ කුමක් ද?

..............................................................................................................

**2.** පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි** නම් '✓' ලකුණ ද **වැරදි** නම් '**×**' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(i) කුඹුරට බැසගත් ගොවියෝ කඩිසරව වැඩ කරති. (.........)

(ii) කමල් වේදිකා නාට්‍යයක් නරඹයි. (.........)

(iii) ගිරවා කෑගසමින් කැලෑවට පියාඹති. (.........)

(iv) තද වර්ෂාවට පාලම කඩා වැටුණේ ය. (.........)

(v) ගීතා මිහිරි හඬින් ගීතයක් ගායනා කළහ. (.........)

**3.** ඒක වචන වර්තමාන කාල ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) බලයි (2) බැලුවේ ය (3) බලති

**4.** පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (1) ප්‍රදර්ශන (2) ප්‍රධර්ශන (3) ප්‍රදර්ශණ

(ii) (1) ළඩරුවා (2) ලදරුවා (3) ළදරුවා

(iii) (1) ලේකිඛාව (2) ලේඛිකාව (3) ලේකිකාව

විභාග අංකය :....................................

**5.** පහත සඳහන් වාක්‍යය අතීත කාල බහු වචනයට හරවා ලියන්න.

මම පාසල් වැඩවල නිරත වෙමි.

................................................................................................................................

**6.** පහත සඳහන් එක් එක් වචනයට ගැළපෙන සමාන පදයක් බැගින් ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.

(i) කැලය : ..................................   (ii) පොත : ..................................

**7.** පහත සඳහන් වගන්තියේ **වැරදි** අක්ෂර සහිත වචන **දෙකක්** ඇත. එම වචන දෙක තෝරා **නිවැරදි කර** එම වචන **දෙක පමණක්** තිත් ඉර මත ලියන්න.

නිසළ වූ නදිය තිල්මිණි තලාවක් සේ බබලයි.

(i) ....................................   (ii) ....................................

**8.** එක් එක් වගන්තිවල අදහසට ගැළපෙන ප්‍රස්ථාව පිරුළ වරහන් තුළින් තෝරා දී ඇති හිස්තැනෙහි ලියන්න.

(උගත මනා ශිල්පය මයි මතු රැකෙනා/ ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න/ පනින්න පෙර සිතා බලනු/ ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න/ ඉඟුරු දී මිරිස් ගත්තා වගේ)

(i) ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න.

................................................................................................................

(ii) ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න.


................................................................................................................

**9.** සුදුසු විරාම ලකුණු යොදන්න.


| |
|---|
| පිරිසිදු පරිසරයක් යන තේමාව පැහැදිලි වන සේ පෝස්ටර් තරගයක් පවත්වන ලදී |

**10.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i)



(ii)



**11.** පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) has / ten / sister / rupees / My :..................................................................

(ii) buy / bat / a / want / We / to :..................................................................

**12.** එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) Parents : ..................................   (ii) Fire : ..................................


**13.** 'කාල් (கால்)' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

................................................................................................................................

**14.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

එළියට යන්න ද? : ................................................................................

[හතරවැනි පිටුව බලන්න.

**15.** 


ගණක රාමුවෙහි නිරූපිත සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.................................................................

**16.**

| | |
|---|---|
| 5 | 4 |
| 7 | 9 |

කොටුව තුළ ඇති සියලු ම ඉලක්කම් යොදාගෙන 4 ඉලක්කමෙන් නිරූපිත අගය 400 ද 7 ඉලක්කමෙන් නිරූපිත අගය 70 ද වන ඉලක්කම් හතරේ සංඛ්‍යා **දෙකක්** ලියන්න.

.................................... , ....................................

**17.** පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැන් දෙකට ගැළපෙන සංඛ්‍යා **දෙක** ලියන්න.

.............. , .............. , 15, 19, 23, 27

**18.** 20 650 සංඛ්‍යාව **අකුරෙන්** ලියන්න. : .................................................................

**19.** බස් රථයක් මගීන් 55 දෙනකු සහිතව පළමුවැනි නැවතුමෙන් ගමන් ආරම්භ කරයි. දෙවැනි නැවතුමේදී මගීන් 8 දෙනකු බසයෙන් බසින ලද අතර 12 දෙනෙක් බස් රථයට ගොඩ වූහ. දෙවැනි නැවතුමෙන් ගමන් අරඹන විට බස් රථයේ සිටි මගීන් ගණන කීය ද?

: ....................................

**20.** අඹ ගෙඩි 16කින් හතරෙන් පංගු දෙකක් ($\frac{2}{4}$) යනු අඹ ගෙඩි කීය ද?

: ....................................

**21.** එකිනෙකට සමාන මුහුණත් 6ක් සහ දාර 12ක් සහිත ජ්‍යාමිතික ඝන වස්තුව කුමක් ද?

: ....................................

**22.** මීටර 45ක් දිග තාප්පයක් බැඳීම සඳහා දින දෙකක් ගත විය. පළමුවැනි දිනයේ දී මීටර 27 සෙන්ටිමීටර 75ක දිගක් බැඳ අවසන් විය. දෙවන දිනයේ දී බඳින ලද දිග කොපමණ ද?

: මීටර ........... සෙන්ටිමීටර ...........

**23.** දැන් වේලාව පෙරවරු 11.00 නම් තව පැය 2යි මිනිත්තු 30කට පසුව වේලාව කීය ද?

: ....................................


**24.** සිසුන් 235 දෙනකුට අධ්‍යාපන චාරිකාවක් යාම සඳහා බස්රථ 5ක් යොදා ගන්නා ලදී. සෑම බස් රථයක ම සමාන සිසුන් සංඛ්‍යාවක් ගමන් කළේ නම් එක් බස් රථයක ගමන් කළ සිසුන් ගණන කීය ද?

: ....................................

**25.** එක් දිනක දී වෙළඳසැලක තිබූ පරිප්පු 25 kg න් විකුණන ලද පරිප්පු ප්‍රමාණය 12 kg 750 g කි. එදින ඉතුරු වූ පරිප්පු ප්‍රමාණය කොපමණ ද?

: ............ kg, ............ g

**26.** නිමල් පැන්සලෙහි දිග මැනීම සඳහා පහත රූපයේ දැක්වෙන ලෙස සෙන්ටිමීටර කෝදුවක් යොදා ගත්තේ ය. පැන්සලෙහි දිග කොපමණ ද?





: සෙන්ටිමීටර ..............................

**27.** පහත බිල්පතෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | ඒකක මිල (රුපියල්) | ඒකක ගණන | මුදල (රුපියල්) |
|---|---|---|---|
| අභ්‍යාස පොත | 85 | 3 | ......... |
| පැස්ටල් පාට පෙට්ටිය | 270 | ......... | 540 |
| | | **එකතුව** | 795 |

**28.** ජලය ලීටර 2ක් අල්ලන භාජනයක් සම්පූර්ණයෙන් පිරවීමට මිලි ලීටර 500 කෝප්පයකින් ජලය දැමිය යුතු වාර ගණන කීය ද? ..............................................................

**29.** සිසුන් කණ්ඩායමක් වඩාත් කැමති වර්ණය පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




(i) කහ වර්ණයට වඩා දම් වර්ණයට කැමති සිසුන් ගණන කොපමණ ද?

..............................................................

(ii) කණ්ඩායමේ සිටින මුළු සිසුන් ගණන කොපමණ ද?

..............................................................

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න**.

**30.** කොළ කැඳ සකස් කිරීමේ දී සුදුසු කොළ වර්ගයක් සහ පොල්වලට අමතරව අවශ්‍ය වන්නේ,
(1) මස් වර්ගයකි. (2) පලතුරු වර්ගයකි. (3) සහල් වර්ගයකි.

**31.** පස සාරවත් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාව කුමක් ද?
(1) ආහාර වර්ග තැම්බූ උණු වතුර පසට දැමීම
(2) දිරාපත්වන කුණු රොඩු පසට එකතු කිරීම
(3) කෘමිනාශක අඩංගු බෝතල් සේදූ වතුර පසට දැමීම

**32.** විටමින් C බහුලව අඩංගු ආහාරයක් වන්නේ,
(1) පේර ය. (2) රට කජු ය. (3) සෝයා බෝංචි ය.

**33.** කඳු බෑවුමක පිහිටි ගසක් සුළඟකට මුල් ඉදිරී වැටී තිබුණි. ඒ සඳහා වඩාත් හේතුවිය හැකි කරුණ කුමක් ද?
(1) ගස මල්වලින් බරවී තිබීම
(2) එම ස්ථානයේ පස සෝදායාමට ලක්වී තිබීම
(3) ගසෙහි කුරුල්ලන්ගේ කූඩු තිබීම

**34.** 'තුවාය' පෞද්ගලිකව පරිහරණය කළ යුතු දෙයක් වන්නේ,
(1) නිවසේ අන් අයද එසේ කරන නිසා ය.
(2) අලංකාරව තබා ගැනීම සඳහා ය.
(3) ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහා ය.

**35.** 'කාබෝහයිඩ්රේට්' පෝෂ්‍ය පදාර්ථය ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට **නොලැබුණු** විට ඇතිවන තත්ත්වයකි,
(1) කුසගිනි නොදැනීම. (2) ශරීරයේ බර අඩු වීම. (3) මුඛය ආශ්‍රිත රෝග ඇතිවීම.

**36.** අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගය කුමක් ද?
(1) බරවා (2) දියවැඩියාව (3) උණසන්නිපාතය

**37.** 'මොනරවිල කැප්පෙටිපොළ දිසාව' යන චරිතය ශ්‍රී ලාංකිකයන්ට වැදගත් වන්නේ,
(1) විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට බේරා ගැනීමට කටයුතු කළ බැවිනි.
(2) විශිෂ්ට ගණයේ ආගමික පොත්පත් රචනා කළ බැවිනි.
(3) නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කළ බැවිනි.


38. ගෙවත්තට පැමිණෙන පක්ෂියකු වන ඇටිකුකුළාට,
   (1) කළු පැහැති පිහාටු සහ සුදු පැහැති ඇස් ඇත.
   (2) කළු පැහැති හා නිල් පැහැති පිහාටු සහ රතු පැහැති ඇස් ඇත.
   (3) කළු පැහැති හා දුඹුරු පැහැති පිහාටු සහ රතු පැහැති ඇස් ඇත.

39. සුමට ක්‍රියාකාරිත්වය සඳහා තෙල් යොදන උපකරණය කුමක් ද?
   (1) අලවංගුව (2) විල්බැරෝව (3) මිටිය

40. ඖෂධ භාවිතයේ දී සිදු **නොකළ** යුත්තේ,
   (1) ඉක්මන් සුවය සඳහා වැඩි මාත්‍රාවක් ගැනීමයි.
   (2) ආහාරයට පෙර හා පසු ලෙස සැලකිලිමත් වීමයි.
   (3) දිනකට නියමිත වාර ගණන අනුව ඖෂධ ගැනීමයි.

41. යම් පුද්ගලයකු දියේ ගිලෙන බව දුටු විට **ක්ෂණිකව** කළ යුතු සුදුසු ම දේ කුමක් ද?
   (1) උදවු ඉල්ලා කෑ ගැසීම
   (2) දිය මතු පිටට පැමිණෙන තෙක් බලා සිටීම
   (3) බේරා ගැනීමට තමන් ද දියට පැනීම

42. හැඩයෙන් වෙනස්, ධාරිතාව සමාන, සම්පූර්ණයෙන් ම ජලය පුරවා ඇති බඳුන් තුනක් පහත දක්වා ඇත. මේ පිළිබඳ ව නිවැරදි වගන්තිය තෝරන්න.



   (1) ජලය වැඩි ප්‍රමාණයක් ඇත්තේ මැද තිබෙන භාජනයේ ය.
   (2) ජලයට නිශ්චිත වූ හැඩයක් ඇත.
   (3) බඳුන් තුනේ ම ඇත්තේ සමාන ජල ප්‍රමාණයකි.

43. සෙක්කුව යොදාගන්නේ,
   (1) කුඹුරු වැඩට ය. (2) තෙල් සිඳ ගැනීමට ය. (3) රෙදි විවීමට ය.

44. යම් පරිසරයක ශාක භක්ෂක සතුන් පමණක් සිටින විට පහත සඳහන් කුමක් සිදුවිය හැකි ද?
   (1) සතුන්ගේ සංඛ්‍යාව ඉතා ඉක්මනින් වැඩි වී ඉන් පසු අඩු වේ.
   (2) ඉතා හොඳින් වැඩුණු ශාක පද්ධතියක් පරිසරයේ ඇති වේ.
   (3) කුඩා සතුන්, විශාල සතුන්ගේ ආහාරය බවට පත් වේ.

45. විදුලි බලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාව කුමක් ද?
   (1) ආහාර උණුසුම්ව තිබිය දී ශීතකරණයෙහි ඇමීම
   (2) විදුලි ඉස්ත්‍රික්කය භාවිතයේ දී දින කිහිපයකට අවශ්‍ය ඇඳුම් එකවර මැද ගැනීම
   (3) ජලය උණුකර ගැනීම සඳහා විදුලි කේතලය භාවිත කිරීම

46. මහා මාර්ගයේ පයින් ගමන් කරන විට දකුණෙන් ගමන් කිරීම නිසා ඇතිවන වාසිදායක තත්ත්වයක් **නොවන්නේ,**
   (1) ඉදිරියෙන් එන වාහන හොඳින් පෙනීමයි.
   (2) පිටුපසින් එන වාහන තමාට ඈතින් ගමන් කිරීමයි.
   (3) පාර හරහා යාමේදී දෙපස බැලීම අවශ්‍ය නොවීමයි.




සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

47. වර්ණවත්, සුවඳවත් මෙන් ම රසැති ගෙඩි සහිත ශාකයක පැතිරීම බහුලව ම සිදුවන්නේ කුමන ආකාරයෙන් ද?

(1) සතුන් මඟින් (2) ජලය මගින් (3) සුළඟ මගින්


48.




ඉහත භාජනය ජනේලයක් අසල තබා දින කිහිපයකින් බැලූ විට එක ම මෑ බීජයක්වත් පැළවී නොතිබිණි. හේතුව කුමක් විය හැකි ද?

(1) හිරු එළිය නොමැතිකම (2) වාතය නොමැතිකම (3) ජලය නොමැතිකම

49.




ඉහත දැක්වෙන ලෙස උපකරණ යොදාගෙන විවිධ රටවලට දිවා සහ රාත්‍රී කාල ඇති වන අයුරු ආදර්ශනය කිරීමේදී සිදුකළ යුතු කරුණක් වන්නේ,

(1) විදුලි පන්දම් එළිය සම්පූර්ණ ලෝක ගෝලය ආලෝකවත් වන ලෙස විහිදුවීම ය.


(2) ආදර්ශ ලෝක ගෝලය එහි අක්ෂය වටා කර කැවීම ය.

(3) විදුලි පන්දම ආදර්ශ ලෝක ගෝලය වටා කර කැවීම ය.

50. මිනිසා බහුලව භාවිත කරන ඖෂධයක් නිෂ්පාදනය කරන සත්ත්වයෙක් වන්නේ,

(1) මී මැස්සා ය. (2) ගැඩවිලා ය. (3) මැස්සා ය.

51.




අළුත් කිකිළි බිත්තරයක් ජලයේ පාවෙන ආකාරය ඉහත රූපසටහනින් දැක්වේ. මෙම භාජනයේ තිබෙන්නේ,

(1) පිරිසිදු සිසිල් ජලයයි. (2) ලුණු මිශ්‍ර සිසිල් ජලයයි. (3) පිරිසිදු උණුසුම් ජලයයි.

52. සාමූහිකව ජීවත් වීම සඳහා තේරුම් ගත යුතු වැදගත් කරුණක් වන්නේ කුමක් ද?

(1) තමාගේ අදහස් අනුව ම කටයුතු කිරීමට අන් අය පෙලඹවිය යුතු බව

(2) තමා අකමැති දේවල්වලට අන් සියලු දෙනාමත් අකමැති බව

(3) තමා කැමති දේවල්වලට අකමැති අයද සිටිය හැකි බව

53. සතුරන්ගෙන් ආරක්ෂාවීමට සතුන් හැඩගැසී ඇති ආකාරයක් වන්නේ,

(1) ශාකවල කොළ පැහැති පත්‍ර අතර කොළ පැහැති පණුවන් සිටීමයි.

(2) ගිරවාට යම් යම් දේ කැපීමට තියුණු හොටක් තිබීමයි.

(3) සර්පයින්ට එළියට දැමිය හැකි දිගු දිවක් තිබීමයි.

54. රාජ්‍ය ලාංඡනයේ ඇති 'වී කරල්වලින්' නිරූපණය වන්නේ,

(1) සෞභාග්‍ය හා පරිපූර්ණ බවයි.

(2) ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වයයි.

(3) සදාතන පැවැත්මයි.

**55.** දිනපතා ප්‍රමාණවත් පරිදි ජලය පානය කිරීම

(1) මුත්‍රා කිරීමේ අපහසුවක් ඇති වීමට හේතුවක් වේ.

(2) සිරුර අධික ලෙස තරබාරු වීමට හේතුවක් වේ.

(3) ශාරීරික නීරෝගී බවට හේතුවක් වේ.

**56.** සපත්තුවේ අඩිය ගෙවී තිබූ බැවින් අළුත් අඩියක් දමා තම සපත්තු සකස් කරගත් බව දසුන් පැවසුවේ ය. ඔහුගේ ක්‍රියාව වඩාත් හොඳින් විස්තර වන්නේ පහත සඳහන් කුමන වගන්තියෙන් ද?

(1) භාණ්ඩ නිසි පරිදි නඩත්තු කළ යුතු ය.

(2) භාණ්ඩ අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ය.

(3) භාණ්ඩ හොඳින් පිරිසිදු කර තැබිය යුතු ය.


**57.** අභය භූමි පවත්වා ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ,

(1) සතුන්ට ඔවුන්ගේ පරිසරයේ ම ජීවත්වීමට අවස්ථාව සැලසීමයි.

(2) සතුන් අතර එකිනෙකාට සිදුවන හිංසාකාරී ක්‍රියා අවම කිරීමයි.

(3) සතුන්ගෙන් පහසුවෙන් ආහාර ලබා ගැනීමයි.

**58.** කඩදාසියක් මත අල්පෙනෙති විසුරුවා දණ්ඩ චුම්බකයක් ඒ මත තැබූ විට අල්පෙනෙති ආකර්ෂණය වීම නිවැරදිව දක්වා ඇත්තේ පහත කුමන රූපසටහනෙන් ද?




**59.** නිවසේ විදුලි බුබුළක් මාරු කිරීමේදී සිදු **නොකළ** යුතු ක්‍රියාව කුමක් ද?

(1) ප්‍රධාන පරිපථ යොමුව විසන්ධි කිරීම

(2) වැඩිහිටි සාමාජිකයෙකුගේ අධීක්ෂණය මත සිදු කිරීම

(3) බල්බය ගැලවීමට තෙත රෙදි කැබැල්ලක් යොදා ගැනීම

**60.** සමන්ගේ නිවසට ජනිත් පැමිණියේ තද වැස්සේ ය. ඒ වන විට සමන්ගේ ගෙමිදුල ජලයෙන් පිරී තිබුණි. 'කඩදාසි ඔරු පා කරමු' යැයි ජනිත් කීවේ ය. සමන්, ඔබ යැයි සිතා ඉන් පසු සිදුකළ දේ පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩුවිය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..................................................................................................

..................................................................................................

2. ..................................................................................................

..................................................................................................

3. ..................................................................................................

..................................................................................................

***

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

LOL Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

# 25% OFF ALL BOOKS

Including Exercise Books, CR Books, and B5 Books



**ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්**

## ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

**Cash On Delivery Available**